**ජනාධිපතිවරයාගේ අරමුදල - 2015**

**---------------------------------------------**

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 9(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ජනාධිපතිවරයාගේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.159,124,409 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.474,631,939 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ රු.315,507,530 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම් රු.333,398,900 කින් අඩුවීම ද, ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.27,900,000 ක පොලී කපාහැරීමද ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත අනුව අරමුදලේ අරමුණු ලෙස දරිද්‍රතාවයට සහන සැලසීම සඳහාද, අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහා ද, ආගම නංවාලීම සඳහාද, ජාතිය වෙනුවෙන් සේවයක් කරඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සහ මහජනතාවගේ සුභසිද්ධිය හෝ යහපත පිණිස වූ වෙනත් යම් කාර්යය සඳහා මුදල් සැපයීම දක්වා තිබුණි.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකරනලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම්, සංස්කෘතික කටයුතු, ආගමික කටයුතු, සුභසාධන කටයුතු, අධ්‍යාපනික කටයුතු, ක්‍රීඩා හා කලා කටයුතු, දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය හා විශේෂ ව්‍යාපෘති සඳහා එකතුව රු. 1,026,067,188 ක් වැය කර තිබුණි. එම මුළු වියදමෙන් වෛද්‍යාධාර සඳහා රු. 900,556,661 ක් දරා තිබුණ අතර ඉන් මහජන නියෝජිතයන් 05 දෙනෙක් වෙනුවෙන් රු. 6,117,406 ක් ද වෙනත් පාර්ශවයන් 6045 ක් වෙනුවෙන් රු. 894,439,255 ක්ද වැයකර තිබුණි. එම ප්‍රමාණය මුළු වියදමින් සියයට 87.7 ක් නියෝජනය විය. විදේශීය හා දේශීය ශිෂ්‍යත්ව සඳහා මුළු වියදමෙන් සියයට 8.6 ක් ද අරමුදලේ අනෙකුත් අරමුණු ඉටු කිරීම සඳහා සියයට 3.7ක් ද වියදම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හෘද සැත්කම් 4,584 ක් සඳහා රු. 667,499,877 ක් ද, පිළිකා ප්‍රතිකාර 451 ක් සඳහා රු.50,903,468 ක් ද, වකුගඩු බද්ධ කිරීම් හා රුධිර කාන්දුකරණය කිරීම් 336 ක් සඳහා රු 66,177,256 ක් ද, වෙනත් ප්‍රතිකාර 679 ක් සඳහා රු.115,976,061 ක් ද වෛද්‍යාධාර වශයෙන් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රෝගීන් 5,892 ක් සඳහා රු.810,385,663 ක වැය කිරීම සමඟ සැසඳීමේදී රෝගීන් ප්‍රමාණය 158 කින් වැඩිවී ඇති අතර වෛද්‍යාධාර වියදම රු.90,170,998 කින් වැඩිවී තිබුණි.

(ඇ) අධ්‍යාපන කටයුතු හා ආගමික කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් පිළිවෙලින් සියයට 17.9 කින් හා සියයට 75.7 කින් පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණි.

**4.2 හඳුනාගන්නා ලද පාඩු**

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබූ රු. 195,000,000 ක ණය ශේෂය සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සමුච්චිත ණය පොලිය රු. 343,806,164 ක් වන අතර 2016 පෙබරවාරි

10 දින පවත්වන ලද පාලක මණ්ඩල රැස්වීමේදී එකඟවූ පරිදි ඉන් රු.27,900,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකශනයෙන්ද, රු. 315,906,164 ක් රඳවාගත් ලාභයෙන්ද කපාහැර තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගෙන් ජොෂ්ඨ සහකාර ලේකම්, ගණකාධිකාරී ඇතුළු නිලධාරීන් 35 දෙනෙක් අරමුදලේ සේවය වෙනුවෙන් අනුයුක්ත කර තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

--------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදි සියයට 36 සිට සියයට 813 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

ඇමුණුම **01**

**මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| **විස්තරය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | |
|---|---|---|
| | **2015** | **2014** |
| **ආදායම** | රු. | රු. |
| දායකයන් ලැබීම | 44,006,333 | 65,255,844 |
| පොලී ආදායම | 177,936,245 | 214,931,518 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම | 1,727,063,739 | 2,060,462,639 |
| | 1,949,006,317 | 2,340,650,001 |
| **වියදම** | | |
| විගණන ගාස්තු | 160,000 | 160,000 |
| වෛද්‍යාධාර ගෙවීම | 900,556,662 | 810,385,663 |
| සංස්කෘතික කටයුතු | 2,750,000 | 1,225,000 |
| ආගමික කටයුතු | 3,650,000 | 15,050,000 |
| සුභ සාධන කටයුතු | 8,557,477 | 8,715,000 |
| අධ්‍යාපන කටයුතු | 1,100,000 | 1,340,000 |
| ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ වියදම් | 87,853,050 | 110,774,000 |
| විශේෂ ව්‍යාපෘති | 20,000,000 | 20,000,000 |
| ක්‍රීඩා හා කලා කටයුතු | 1,600,000 | 600,000 |
| මහපොල උසස් අධ්‍යාපන භාරකාර අරමුදලට 50% ක දායකත්වය | 735,754,719 | 897,768,399 |
| ලැබිය යුතු පොලී කපාහැරීම | 27,900,000 | - |
| | 1,789,881,908 | 1,866,018,062 |
| වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය | 159,124,409 | 474,631,939 |

ඇමුණුම 02

**අරමුදලට අයත් මුදල් ආයෝජනය පිළිබඳ ප්‍රකාශය**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත සඳහන් වගුවෙන් දැක්වේ.

| ආයෝජන වර්ගය | 2015 ජනවාරි 01 දිනට ශේෂය | 2015 වර්ෂයේ ආයෝජන | 2015 වර්ෂයේ ආපසු ගැනීම් | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් | 1,390,125,000 | 307,567,500 | 75,125,000 | 1,622,567,500 |
| මහජන බැංකුව ස්ථාවර තැන්පත් | 12,080,000 | 100,780,000 | 80,000 | 112,780,000 |
| ලංකා බැංකුව ස්ථාවර තැන්පත් | 250,825,000 | - | 250,825,000 | - |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජන | 2,200,000 | - | - | 2,200,000 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 338,790,000 | - | - | 338,790,000 |
| | 1,994,020,000 | 408,347,500 | 326,030,000 | 2,076,337,500 |